# 7 ශ්‍රේණිය

# දෙවන වාරය

# පෙරදිග සංගීතය

# උපදේශාත්මක ගීත රසාස්වාදය හා ගායනය

උපදේශාත්මක ගීත යනු ගීතය තුළින් යම් පණිවිඩයක් උපදේශයක් ලබාදෙන ගී ලෙස හදුන්වයි..

ක්‍රියාකාරකම....

01.පහතින් දක්වා ඇති ගීත ශ්‍රවණය කරන්න.. ඉන් කියවෙන අර් ථය ඔබේ වචනෙන් ලියන්න.

02.උපදේශාත්මක ගීත එකතු කර පොත් පිංචක් සකසන්න.

කරුණාව සමග හොද හිත පතුරන්න සැම කෙරේ

සැමදාම ඉන්න පුළුවනි සතුටින්ම ලෝකයේ

ලොකු අයගෙ කීම නාසා හැසිරෙන්න හොදම නෑ

ඉවසීම ජය ගනී

වන මලක සිරිය වාගෙයි ඔබ වෙන්න ලෝකයේ

හැමදාම ජය ගනී

හොද ළමයි ඉන්නෙ කොතනද සරසවිය එතන වේ

හොද ළමයි මල් වගේ

ගායනය - චන්ද්‍රා කබ්රාල්

පාන්කිරිත්තා තක්කිට තරිකිට උඩ පැන පැන නටතෙයි
පාන්කිරිත්තා රබාන අරගෙන කරබා ගෙන වයතෙයි
උන්ගේ පැටවුන් වටේට ඉදගෙන දැතින් හඩ තලතෙයි
මේවා බල බල කළු කැදැත්තෙක් කීචි බීචි කියතෙයි

පානකිරිත්තා තමන්ගෙ පාඩුවෙ නැටුම පටන් ගත්තේ
අහල පහල කිසිවෙකුටත් ඒකෙන් හිරිහැරයක් නැත්තේ
කොහේද ඉදගෙන කළු කැදැත්තා වහලා අර අත්තේ
උන්ගේ නැටුමට බාධා කරමින් ගීය පටන් ගත්තේ

පාන්කිරිත්තා නැටුම නවත්තා කේන්තියෙන් ආවා
කැදැත්තාගේ කළු අත්තටුවෙන් අල්ලා සෙලවූවා
ඊට පස්සෙ ඌ සට සට ගාලා මොන මොනවද කීවා
ළගට කිට්ටු වී මාද ගොළුවතින් ඊට සවන් පෑවා

අනුන්ගෙ වැඩ ගැන විවේචනය කරකරක ඉන්නවට වඩා
තමන් දන්නදේ හරියට කියපන් කියලා කීය හඩා

ගායනය - ෆෙඩී සිල්වා
පද මාලාව-ප්‍රේමකීර් ති ද අල්විස්

# 7 ශ්‍රේණිය

# දෙවන වාරය

# පෙරදිග සංගීතය

## ගී අනුවාදන

ගී අනුවාදනය යනු ගීතයකට තනුව (melody) ස්වර වාද්‍ය භාණ්ඩයකින් හෝ තබ්ලා තරංග,ජල තරංග,වැනි ස්වරස්ථාන පිහිටුවා තරංගයකින් වාදනය කිරීමයි.

ගීතයක් වාදනය කිරීමේ දී එම ගීතයේ හඳුන්වාදීමේ වාදන (introduction)අතුරු වාදනය (interlude) කොටස්ද නියමිත පරිදි භාණ්ඩ යොදා වාදනය කරන අතරතුර ගීතයේ තනුව තෝරා ගත් භාණ්ඩයකින් වාදනය කරන විට ගී අනු වාදනයක නියම රස ලැබිය හැකිය.

විශේෂයෙන් ගී අනු වාදනයක සාර් ථකත්වය රදා පවතින්නේ වාද්‍ය භාණ්ඩය වාදනය කරන්නා සතු කුසලතාවය මතය.කිසියම් ගීතයක් එම ගීතය ගායක ගායකයා හෝ ගායිකාව ගයන ආකාරයට රස මතුවන අයුරින් වාදනය කළ හැකි නම් ගී අනු වාදනයක උපරිම රස විදිය හැක.

සංගීත විෂයය හදාරන සිසු සිසුවියන් විසින් තෝරා ගන්නා සංගීත භාණ්ඩ වල මූලික ස්වර අභ්‍යාස නිසි පරිදි පුහුණු වීම් කර ස්වර ප්‍රස්තාර කියවීමේ ශිල්ප ක්‍රම හොදින් අධ්‍යයනය කර ඇත් නම් මෙම පාඩම වඩාත් සාර් ථක කර ගත හැකි අතර ප්‍රවීන වාද්‍ය ශිල්පීන් ඉදිරිපත් කළ ගී අනු වාදන කිහිපයක් නැරඹීම , රස විදීම ඉතා වැදගත්ය.

ගී අනු වාදන ඉතා රසවත්ව ඉදිරිපත් කරන වාද්‍ය ශිල්පීන්ගේ ගී අනු වාදන විවිධ වාද්‍ය භාණ්ඩ අනුව අන්තර් ජාලයට (youtube)වලින් අවශ්‍ය වාද්‍ය ශිල්පීන් හෝ වාදන නැරඹිය හැක.එසේම CD,VCD,DVD,BLUEREY තැටි වලින්ද ලබා ගත හැක.

ගී තනු වාදන ඉදිරිපත් කර ඇති ප්‍රවීන වාද්‍ය ශිල්පීන් කිහිප දෙනෙකි.

වී.හේමපාල පෙරේරා මහතා -බටනලා

ඩී.ඩී ගුණසේන මහතා - වයලීනය

ප්‍රදීප් රත්නායක මහතා - සිතාර්

මහින්ද බණ්ඩාර මහතා - ගිටාර්

තමන් තෝරා ගත් වාද්‍ය භාණ්ඩයට අදාළව ප්‍රවීන ශිල්පීන්ගේ ගී අනුවාදන දෙකක් තුනක් රසවිද ගී අනුවාදනයක් සඳහා සූදානම් වීම ඉතා වැදගත් වේ.

ගීතයක වචන කියවෙන ආකාරයට ඉතා අලංකාර ලෙස ප්‍රවීන වාද්‍ය ශිල්පීන් ගී අනු වාදන ඉදිරිපත් කර ඇති බව අපට අවබෝධ කර ගත හැකිය.

ගී අනු වාදනයකදී ගී අනුවාදනය ශ්‍රවණය කර භාණ්ඩය හඳුනා ගැනීමටත් , ගීතය නම් කිරීමටත් හැකි වන අතර විවේකය ඵලදායි කර ගැනීමට,ශල්පීය කුසලතා සංවර් ධනයට,මානසික තත්වය දියුණු කොට සිත සැහැල්ලු කර ගැනීමට සිය ජීවිතයට සොඳුරු ආශ්වාදයක් ලැබීමට ගී අනුවාදන ප්‍රයෝජනවත්ය.

ක්‍රියාකාරකම්....

01..ගී අනු වාදනයක් යනු කුමක්ද?

02..ගී අනු වාදන සඳහා භාවිතා කරන සංගීත භාණ්ඩ මොනවාද?

03..ගී අනු වාදන ශ්‍රවණය කිරීමෙන් ඇතිවන වාසි මොනාවාද?

04..ඉහතින් සඳහන් කළ වාද්‍ය ශිල්පීන්ගේ ගී අනු වාදන ශ්‍රවණය කරන්න.

# 7 ශ්‍රේණිය

# දෙවන වාරය

# පෙරදිග සංගීතය

## *තාලානුකූල ස්වර අභ්‍යාස*

සංගීත විෂය හදාරන දරුවන් ස්වර අභ්‍යාසයේ යෙදීම මුල සිටම කළ යුතු කාර් යයකි.සංගීත විෂය හදාරන ආධුනිකයෙක්ද ගායනයෙන් හෝ වාදනයෙන් ස්වර අභ්‍යාස වල යෙදිය යුතුය. ගායකයෙකු නම් තම කටහඬ පාලනය කර ගැනීමටත් නිවැරදි ස්වර ස්ථානවලින් යුක්තව ගායනය රසවත්ව ඉදිරිපත් කිරීමටත් ස්වර අභ්‍යාස වල යෙදීම අත්‍යවශ්‍ය වේ. ස්වර අභ්‍යාස තාලානුකූලව යොදා ගැනීමෙන් මිහිරිතාවය ඇති කළ හැකි වේ. එබැවින් තාලානුකූල ස්වර අභ්‍යාස වල රිද්මයක් හෝ තාලයක් ඇත.

ඔබ මීට පෙර පෙරදිග සංගීතයේ ස්වර 7 පිළිබඳවත් එම ස්වර 7න් ගොඩනැගෙන ස්වර අභ්‍යාස පිළිබඳවත් ඉගෙන ගන්නට ඇති.අපි දැන් කෝමළ ග නි යොදා ස්වර අභ්‍යාස ගොඩ නගමු. **පහත දැක්වෙන ස්වර අභ්‍යාසය ගොඩ නැගී ඇති අයුරු බලන්න.**

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | | | | | | | | | | | | | | | | | | | |
| නි | | | | | | | | | | | | | | | | | | | |
| ධ | | | | | | | | | | | | | | | | | | | |
| ප | | | | | | | | | | | | | | | | | | | |
| ම | | | | | | ම | | | | | | | | | | | | | |
| ග | | | ග | | ග | | | | | | | | | | | | | | |
| රි | | රි | | රි | | | | | | | | | | | | | | | |
| ස | ස | | | | | | | | | | | | | | | | | | |

දැන් ඔබ කොටු රූල් කඩදාසියක මෙම ස්වර අභ්‍යාසය ඉදිරියට ගොඩනගන්න උත්සහ කරන්න.

ඔබ ගොඩ නගා ගත් ස්වර අභ්‍යාසය පියවරෙන් පියවර ගායනය කිරීමට උත්සහකරන්න. තවත් ස්වර අභ්‍යාසයක් ගොඩ නගමු..




පහත සදහන් ස්වර අභ්‍යාස උච්ච ස දක්වා ගොඩ නගන්න. එම ස්වර ගායනයට උත්සහ කරන්න.

ස්වර පුවරු භාණ්ඩයක් ඇත්නම් වාදනය කරන්න උත්සහ කරන්න.

**පහත සදහන් ස්වර අභ්‍යාස උච්ච ස දක්වා ගොඩ නගන්න. එම ස්වර අභ්‍යාස ගායනයට හුරු වන්න.**

1. ස රි ගු ම , රි ගු ම ප ,
........................................................................................................

2. ස - සරිගුරිස- ,රි-රිගුමගුරි,
................................................................................................

3. සරිගුරිස,සරිගුමගුරිස,
..........................................................................................................

4. සරිගු,රිගුම,
..........................................................................................................................

5.සරිසරිගු,රිගුරිගුම,..........................................................................
..............

පහත ස්වර අභ්‍යාස වල 3න් වන පියවර ලියන්න උත්සහ කරන්න..

01..සරිගුස,රිගුමරි,..............

02..සගුරිස,රිමගුරි..............

03..සරිස,රිගුරි,...................

04..සරිසග,රිගරිම,.............

05..සරිගරි,රිගමග,.............

දැන් ඔබට  කෝමළ ස්වර අභ්‍යාස ගොඩනැගීම පිළිබඳව අවබෝධයක් ලැබෙන්නට ඇති....

දැන්ඔබ තනිවම කෝමළ ස්වර අභ්‍යාස 5ක් උච්ච ස දක්වා නිර් මාණය කරන්න.....

01..

02..

03..

04..

05

ඔබ ඇතුළු පවුලේ සියලු දෙනාට නිදුක් නිරෝගී බව පතමි.......